# AN EXPERIMENTAL STUDY OF INDIGENOUS KNOWELDGE OF TERMINOLOGY IN RELATION TO ASTROLOGY

R. D. Ananda Tissa[1]

## Abstract

It is important that one who has an important meaningful name shapes his life accordingly. That is the superior result of obtaining a name. In the study of naming histories, important details related to the birth and naming of Prince Sidhuhat are mentioned in Buddhist history. The influence of the language used is also important, as is the religious and cultural environment. Man's attention to language may have started with the beginning of the human race. There are several basic units related to the Sinhala language. A grammar related to naming methods among these units is especially found in the Sinhala speaking society. The influence of the Buddhist environment and related teachings are also based on it. Data collection related to this research is based on personal identification. Accordingly, the points recommended by occult science and astrology knowledge are studied in association with the subject works. Collecting data through primary and secondary sources by surveying Historical sources, chronicles, inscriptions and Sigiriya songs Based on the written literature, Education and other related literature. The collected data would be studied, edited and analyzed systematically using descriptive methods. It is expected that the results of this research would be useful for the studies of scholars, academics, and PG students, especially in the Indigenous Knowledge System (IKS) field of Sri Lanka. As the conclusions, ideas, and suggestions forwarded finally in this research project, they would be used appropriately in educational plans, research activities, Indigenous literature, preservation and conservation of secret teachings, making national policies of IKS, publishing industry and information dissemination in Sri Lanka.

**Keywords:** Classification of letters, forms of letters, poetics, personal nomenclature, Matra Bavitaya

---

[1] Acting Librarian, Library, Gampaha Wickramarachchi University of Indigenous Medicine

Email: anandat@gwu.ac.lk https://orcid.org/0009-0001-1206-2976

Accepted the revised version: 01 December 2023. This work is licensed under CC BY-SA 4.0. To view a copy of this license, visit http://creativecommons.org/licenses/by-sa/4.0/

# නාමකරණය පිළිබඳ දේශීය දැනුම ජ්‍යොතිශ්ශාස්ත්‍රයට අදාළ ව කෙරෙන පර්යේෂණාත්මක අධ්‍යයනයකි


**සාරසංක්ෂේපය**

අර්ථවත් නමක් ඇති අයෙකු ඒ අනුව තම ජීවිතය හැඩගස්වා ගැනීම වැදගත් වේ. නමක් ලැබීමේ උසස් ප්‍රතිඵලය එයයි. නාමකරණය පිළිබඳ කරුණු අධ්‍යයනයේ දී සිදුහත් කුමරුගේ උපත හා නම් තැබීම සම්බන්ධ වැදගත් තොරතුරු බෞද්ධ ඉතිහාසයේ සඳහන් වේ. ආගමික හා සංස්කෘතික පරිසරය මෙන් ම, භාවිත භාෂාවේ බලපෑම ද වැදගත් ය. භාෂාව පිළිබඳ මිනිසාගේ අවධානය මානව වර්ගයාගේ ආරම්භයත් සමඟ ආරම්භ වන්නට ඇත. භාෂාමය විශ්ලේෂණයේ දී සිංහල භාෂාවට අදාළ මූලික ඒකක කිහිපයක් තිබේ. මෙම ඒකක අතර නාමකරණ ක්‍රම සම්බන්ධ ව්‍යාකරණ සිංහල භාෂාව භාවිත සමාජය තුළ විශේෂයෙන් දක්නට ලැබේ. බෞද්ධ පරිසරයේ බලපෑම හා ඒ ආශ්‍රිත ඉගැන්වීම් ද ඒ මත පදනම් වේ. මෙම පර්යේෂණයට අදාළ දත්ත එකතු කිරීම පුද්ගලික හඳුනාගැනීම මත පදනම් වේ. ඒ අනුව ගුප්ත විද්‍යාවෙන් සහ ජ්‍යොතිශ්ශාස්ත්‍ර දැනුමෙන් නිර්දේශිත කරුණු විෂය කෘති ආශ්‍රිතව අධ්‍යයනය කෙරේ. ලිඛිත සාහිත්‍යය, අධ්‍යාපනය සහ වෙනත් ආශ්‍රිත සාහිත්‍ය පදනම් කර ගනිමින් ප්‍රාථමික හා ද්විතීයික මූලාශ්‍ර හරහා දත්ත රැස් කිරීම. එකතු කරන ලද දත්ත විස්තරාත්මක ක්‍රම භාවිත කරමින් ක්‍රමානුකූලව අධ්‍යයනය කිරීම, සංස්කරණය කිරීම සහ විශ්ලේෂණය කෙරිණි. මෙම පර්යේෂණයේ ප්‍රතිඵල ශ්‍රී ලංකාවේ දේශීය දැනුම ක්ෂේත්‍රයේ විද්වතුන්ගේ සහ පශ්චාද් උපාධි සිසුන්ගේ අධ්‍යයන සඳහා ප්‍රයෝජනවත් වනු ඇතැයි අපේක්ෂා කෙරේ. මෙම පර්යේෂණ ව්‍යාපෘතියේ අවසාන වශයෙන් ඉදිරිපත් කරන ලද නිගමන, අදහස් සහ යෝජනා ලෙස, ඔවුන් අධ්‍යාපන සැලසුම්, පර්යේෂණ ක්‍රියාකාරකම්, දේශීය සාහිත්‍ය, රහස් ඉගැන්වීම් සංරක්ෂණය සහ සංරක්ෂණය, දේශීය දැනුම් පද්ධතියේ, ප්‍රකාශන කර්මාන්තයේ සහ ශ්‍රී ලංකාවේ තොරතුරු බෙදා හැරීමේ ජාතික ප්‍රතිපත්ති සැකසීම සඳහා සුදුසු ලෙස භාවිත කළ හැකි ය.


**ප්‍රමුඛ පද:** අක්ෂර වර්ගීකරණය, අක්‍ෂරවල ස්වරූපය, කාව්‍යකරණය, පුද්ගල නාමකරණය, මාත්‍රා භාවිතය

### හැඳින්වීම

නම කියන වචනයෙහි එහි සැබෑ අර්ථය ගැබ් වී තිබේ. නම යනු නමා ගැනීමයි. යම් පිරිසක් අතරින් අපට යම්කිසි පුද්ගලයෙක්, කිසිවෙක් හෝ කෙනෙක් අපේ දෙසට නමා ගැනීමට හෝ ආකර්ශනය කර ගැනීමට භාවිත කරන නම ප්‍රයෝජනවත් වේ. පෙරදිග සමාජයේ නම් තැබීම පිළිබඳ වැදගත් ඉතිහාසයක් ඇත. නාමකරණයේ දී ඊට පාදක වන භාෂාව පිළිබඳ මූලික අධ්‍යයනයක් කළ යුතු ය. අධ්‍යයනයේ පහසුව සඳහා ලෝකයේ පවත්නා සියලු ම භාෂා විවිධාකාරයෙන් වර්ග කෙරේ. එසේ වර්ග කරන එක් ක්‍රමයක් නම් ඥාති සබඳතා (බලගල්ලේ, 1996) සලකමින් කරනු ලබන වර්ගීකරණය යි. ඊට අමතරව එක ම කලාපයක් නියෝජනය කෙරෙන භාෂාවල වාක්‍ය නිර්මාණය සහ පද සිද්ධියෙහි දක්නට ලැබෙන පොදු ලක්ෂණ කෙරෙහි අවධානය යොමු කරමින් කරනු ලබන භාෂා වර්ගීකරණයන් ද, භූගෝලීය කලාපය අනුව කරන වර්ගීකරණය ද වාග්විද්‍යාත්මකව විස්තර කෙරේ.

භූගෝලීය කලාප අනුව කරනු ලබන වර්ගීකරණය සලකනු ලැබුවහොත් ශ්‍රී ලංකාව පිහිටි භූගෝලීය කලාපය හැඳින්විය හැක්කේ දකුණු ආසියානු අනුකලාපය වශයෙනි. ශ්‍රී ලංකාව අයත් වන භූගෝලීය කලාපයත්, දකුණු ඉන්දියාවේ හා ඊසාන දිග මෙන් ම, බටහිර ආසියාවේ පැතිර ඇති භාෂා පිළිබඳ ව අවබෝධයක් ලබා ගැනීම ප්‍රයෝජනවත් වේ. ලෝකයේ ඇති සියලු ම භාෂා කිසියම් මුල් බසකින් විහිද යන්නට ඇත යන විශ්වාසය මත ගොඩනැගුණු මූල භාෂා සංකල්පය මත විමසා බැලිය යුතු ය.

ඓතිහාසික වාග් විද්‍යාඥයින් වැඩි දෙනා පිළිගෙන ඇති ආකාරයට (බලගල්ලේ, 1992) ඉහත කී භූගෝලීය කලාපයෙහි (අ). ඉන්දු යුරෝපීය භාෂා පවුල, (ආ). හැම්ටො සෙමෙටික් භාෂා පවුල, (ඇ). චීන තිබ්බත භාෂා පවුල, (ඈ). ඕස්ට්‍රික් භාෂා පවුල හා (ඉ). ද්‍රවිඩ භාෂා පවුල වශයෙන් ප්‍රධාන භාෂා පවුල් 05ක් හඳුනා ගත හැකි ය. සිංහල භාෂාව ඇතුළත් භාෂා පවුල වන්නේ ඉන්දු යුරෝපීය භාෂා පවුල යි. ඉන්දු යුරෝපීය භාෂා පවුලේ ඉන්දු ඉරානීය හෙවත් ආර්ය භාෂා පවුල සිංහල භාෂාවේ ප්‍රභවය හා සම්බන්ධ ඍජු සබඳතාවක් ඇත. මෙම භාෂා පවුල්වලට අමතරව මෙතෙක් ප්‍රභවාත්මක සම්බන්ධතාවක් අනුව වර්ග නොකෙරුණු භාෂා කීපයක් ද භාවිත වේ. මෙම භාෂා පවුල් අධ්‍යයනයේ

දී ඉන්දු යුරෝපීය භාෂා පවුල විශාල භාෂක සමාජ ගණනාවකින් ද ලොව පුරා ව්‍යාප්තියෙන් ද උසස් සාහිත්‍යය ගණනාවකින් ද ලොව පුරා භාෂා රාශියක් සහිත භාෂා පවුලකි.

**අධ්‍යයන පසුබිම**

සිංහල ව්‍යාකරණයෙහි හෙවත් සිංහල අක්ෂර මාලාවෙහි ඉතිහාසය අනුරාධපුර යුගය දක්වා ඈත අතීතයකට දිවෙයි. විජයාගමනය හා සම්බන්ධ නිදර්ශිත ලේඛන රචනා කරන ලද හෝඩිය හෙවත් අක්ෂර මාලාව සම්බන්ධයෙන් තවමත් නිශ්චිත තීරණවලට පැමිණ නැත. ප්‍රාකෘත, බ්‍රාහ්මීය හෝ සෙල්ලිපි හෝඩියක් ඒ සඳහා භාවිත කර ඇති බව නිරීක්ෂණ වේ. එහි දී ලිඛිත හෝඩිය සම්බන්ධයෙන් මෙම තත්ත්වය ගැඹුරින් විමසා බැලිය යුතු ය. නාමකරණය පිළිබඳ සාහිත්‍යය මූලාශ්‍රය හා ඓතිහාසික තොරතුරු දඹදෙණි යුගයේ රචිත දෛවඥ කාමධේනු නම්_කෘතියෙහි (අනවමදර්ශී, 1989) විසිහතරවන පරිච්ඡේදයේ නාමවිධි යටතේ 103 වන ශ්ලෝකය රාශිවල ස්වභාවය ද, නම් තැබීමේ දී නාමකරණයේ දී භාවිත කළ යුතු සුභ හා අසුභ ගණ පිළිබඳව ද විස්තර කෙරේ.

> ශුභාඃස්‍යුඃස්ථිරරාශීනාං ක්ෂිතිචන්ද්‍රාකර්වායවඃ
> චරාණාශෛ්චව ච රාශීනාංදේ‍යාසමුද්‍රාම්බරානිලාඃ
> ශොභනාඃ ද්විස්වභාවානාමින්ද්‍රක්ෂිති නභෝනලඃ

මේ අනුව ස්ථිර රාශිවල උපනුන්ට භූමි, චන්ද්‍ර, සූර්ය හා වායු ගණවලින් ද, චර රාශිවල උපනුන්ට චන්ද්‍ර, භූමි, ආකාස හා ගිනි ගණවලින් ද නම් තැබීම සුභ වන්නේය යනුවෙන් පූර්වෝක්ත ශ්ලෝකය අර්ථවත් වේ. සුභ හා අසුභ ගණ පිළිබඳ පූර්ණ විස්තරයක් වෙනත් අනුමාතෘකාවක සාකච්ඡා කෙරේ.

සිඳත් සඟරාව ලිවීමේ අරමුණු පිළිබඳ ව කෙරෙන ශාස්ත්‍රීය අධ්‍යයනවල දී මේ කෘතිය ගැන විස්තර සඳහන් වේ. ඒ පිළිබඳ විවිධ මත ඇත. පර්යේෂකයකු සිය විමසුම් ඇස යොමු කරනුයේ ඔහු හෝ ඇය අභිමුඛ වන තොරතුරු විෂයක දැනුම මත වුවද, තීරණ ගැනීමටත්, ජීවිතවල ඉලක්ක ජයග්‍රහණයටත්, භාෂාත්මක තොරතුරු අත්‍යවශ්‍ය වේ. එකී පසුබිම අනුව සිංහල භාෂාවට අදාළ දේශීය දැනුම ඇසුරෙන් සමාජමය පිළිගැනීම් හා වටිනාකම් ද ඊට ආනුෂංගික කරුණු ද පුද්ගල නාමකරණය අධ්‍යයනයට පසුබිම වී තිබේ.

භාෂා විග්‍රහයේ දී සිංහල භාෂාවට අදාළ මූලික ඒකක ව්‍යාකරණානුකූල ස්වරූපයක් පෙන්නුම් කෙරේ. භාෂා විග්‍රහයේ එන මූලික ඒකක, ස්තර, පද, වචන, ශබ්දයෝග හා ව්‍යාකරණය වශයෙන් ඒවා වෙනත් වෙනත් ප්‍රකරණයන් යටතේ හඳුනාගත හැකි ය. මෙකී ඒකක අතරෙන් නම් තබන ක්‍රමවේදයන්ට අදාළ ව්‍යාකරණයක් සිංහල භාෂක සමාජයේ විශේෂයෙන් දක්නට ලැබේ. බෞද්ධාගමික පරිසරයේ බලපෑම හා ඊට අදාළ ඉගැන්වීම් ද එහි දී පාදක වේ. කෙසේ වුවත් පෙරදිග සමාජවල එන පිළිගැනීම් බැහැර කිරීම පරම්පරා ගැටුමක් දක්වා වර්ධනය වීම නොවැළැක්විය හැක්කකි. මේ පසුබිම මත පුද්ගල නාමකරණයට අදාළ දේශීය දැනුම ජ්‍යොතිශ්ශාස්ත්‍රයට අදාළ ලිඛිත මූලාශ්‍රය යටතේ අධ්‍යයනය කෙරේ.

**අධ්‍යයන ගැටලුව**

අධ්‍යයන ගැටලුවක් හඳුනාගැනීම පර්යේෂණ ක්‍රියාවලියෙහි ඉතා වැදගත් පියවරකි. එහි පදනම නම්, සමස්ත අධ්‍යයනයට පාදක වන පර්යේෂණ සැලසුමෙහි කිසියම් දෝෂයක් ඇතිවූයේ නම්, එය පර්යේෂණ අධ්‍යයනයෙහි වලංගුභාවය හා විශ්වසනීයත්වය කෙරෙහි බලපෑමයි. විශේෂිත සදුපදේශ නොමැති වුවත්, යම් යම් පර්යේෂණ ක්‍රම පිළිබඳ කෘතිවල සඳහන් පර්යේෂණ ක්‍රමවේද, අදාළ පර්යේෂණ ගැටලුව, එහි ස්වභාවය පිළිබඳ අධ්‍යයනයේ දී භාවිත කෙරිණි.

පුද්ගල නාමකරණය සම්බන්ධයෙන් ඇති විශ්වාසය හා සමාජීය පිළිගැනීම කෙබඳු ද, ප්‍රථමයෙන් කේන්ද්‍රය සකස්කර ඊට අදාළ ග්‍රහයා තෝරාගැනීම කරන්නේ ද ? උපන් වේලාවට හිමි නැකත හඳුනා ගැනීම හා අදාළ අකුර තෝරාගැනීම කරනු ලබන්නේ කෙසේ ද ? කුමන මට්ටමකින් පවතින්නේ ද, එහි ස්වභාවය කෙසේ ද ? යන්න මෙහි අධ්‍යයන හෙවත් පර්යේෂණ ගැටලුවයි.

**අධ්‍යයනයේ අරමුණ**

මේ පර්යේෂණ අධ්‍යයනයේ මූලික අරමුණ වන්නේ සිංහල භාෂාව ඇසුරෙන් සිංහල අක්ෂරමාලාව පුද්ගල නාමකරණය සඳහා භාවිතයට අදාළ ජ්‍යොතිශ්ශාස්ත්‍රීය පිළිගැනීම දේශීය ඥානය ඇසුරෙන් අධ්‍යයනය කිරීමයි. මේ සඳහා ජ්‍යොතිශ්ශාස්ත්‍ර විෂය හා සමගාමී තාරකා විද්‍යාව, නක්ෂත්‍රයට අදාළ දැනුම මූලික වශයෙන් විමර්ශනය කෙරේ. එමෙන් ම, අංක විද්‍යාව හා ගුප්ත විද්‍යාවන්වල එන

ඉගැන්වීම්වලින් ලබා දෙන ශික්ෂණය කෙරෙහි ද අවධානය යොමු කෙරේ. සමාජීය විද්‍යා පර්යේෂණවල දී අරමුණු ප්‍රධානතම කාර්යයක් ඉටුකරන අතර, මෙම පර්යේෂණය ගුණාත්මක දත්ත හා කරුණු මත පදනම් වූ බැවින් ඒ පිළිබඳ විශේෂ අවධානයක් යොමු කෙරිණි. නාමකරණය පිළිබඳ දේශීය දැනුම ජ්‍යොතිශ්ශාස්ත්‍රයට අදාළ ව කෙරෙන පර්යේෂණාත්මක අධ්‍යයනයකි යන මාතෘකාව පර්යේෂණ අධ්‍යයනයේ ප්‍රධාන අරමුණ වශයෙන් ගෙන ඇත.

**පර්යේෂණ ක්‍රමවේදය**

පුද්ගල නාමකරණය සම්බන්ධයෙන් ඇති විශ්වාස හා සමාජීය පිළිගැනීම කෙබඳු ද ?, කුමන මට්ටමකින් පවතින්නේ ද ?, එහි ස්වභාවය කෙසේ ද ? යන පර්යේෂණ ගැටලුව මූලික කරගත් මෙම මූලික පර්යේෂණය ප්‍රාථමික හා ද්විතීයික මූලාශ්‍ර පදනම්ව අධ්‍යයනය සිදු කෙරිණි. ජ්‍යොතිශ්ශාස්ත්‍රයට අදාළ ව සම්පාදිත ඉතාමත් අර්ථවත් ඉහළ සමාජ ආකර්ෂණයක් සහිත පුද්ගල නම් අන්වර්ථ නම් වශයෙන් ද, එයින් පරිබාහිරව ආරූඪ නාම ද භාවිත වේ. නාමකරණයේ දී මේ උභය පාර්ශ්වයන් මේ පර්යේෂණයට පාදක වන හෙයින් මේ සඳහා යෝග්‍ය වන්නේ දත්ත විශ්ලේෂණය කරන ආකාරය අනුව විස්තරාත්මක පර්යේෂණ ක්‍රමවේදයයි.

**දත්ත රැස්කිරීම**

ප්‍රාථමික දත්ත රැස්කිරීම සඳහා සම්මුඛ සාකච්ඡා ක්‍රමය භාවිත කෙරිණි. පර්යේෂණ මාතෘකාවට අදාළ ව රචිත කෘති වශයෙන් එලු සඳස් ලකුණ, දෛවඥ කාමධේනු, සිදත් සඟරාව වැනි අක්ෂර වර්ගීකරණයන් සම්බන්ධයෙන් රචිත කෘති පාදක කරගෙන ඇත. ජ්‍යොතිශ්ශාස්ත්‍රයට අදාළ නාමකරණය සම්බන්ධයෙන් කරුණු සඳහන් කෘති මෙන් ම, ශාස්ත්‍රීය ලිපි හා අදාළ වන පුවත්පත් ලිපි ද ඇසුරෙන් ද්විතීයික තොරතුරු ලබා ගෙන ඇත.

**අධ්‍යයනයේ සීමා**

පුද්ගල නාමකරණය සඳහා උපන් වේලාවට අනුව කේන්ද්‍රය පරීක්ෂා කෙරේ. එහි ප්‍රතිඵලයක් වශයෙන් ඊට අදාළ ග්‍රහයා තෝරාගනු ලබයි. රවි, චන්ද්‍ර, කුජ හා බුධ ආදී වශයෙන් නව ග්‍රහයන්ට හිමි අකුරු තෝරාගෙන සුදුසු නමක් තබා ගැනීමට අදාළ ව ජ්‍යොතිශ්ශාස්ත්‍රයේ සඳහන් කරුණු පමණක් භාවිත කර ඇත.

**දත්ත විශ්ලේෂණය**

මෙම අධ්‍යයනයේ දී පර්යේෂිත දත්ත විශ්ලේෂණ අනුමාතෘකා යටතේ දක්වා ඇත. නම් තැබීම හෙවත් නාමකරණයේ දී ජ්‍යොතිශ්ශාස්ත්‍රයට අදාළ ව මානව භාෂාවේ ලක්ෂණ, අක්ෂරවල ස්වරූප හෙවත් අක්ෂර වර්ගීරණය, ලුහු ගුරු හෙවත් මාත්‍රා හඳුනා ගැනීම, ලග්නයට හිමි අක්ෂර, සතියේ දිනවලට හිමි අක්ෂර, නැකැත් හිමි පාද අක්ෂර, සමකුල අක්ෂර ස්වකීය භූතයට ගැළපෙන අක්ෂරය භාවිතය වශයෙන් විවිධ විෂය ක්ෂේත්‍රයන් යටතේ දත්ත විශ්ලේෂණය කෙරේ.

**මානව භාෂාවේ ස්වරූපයෙන් හිමි වන නම**

භාෂාව හා මානවයා අතර ඇති සම්බන්ධතාව විස්තර කිරීම මගින් නාමකරණය සඳහා භාෂාවේ බලපෑම සියුම්ව නිරීක්ෂණය කෙරේ. භාෂාව නම් අදහස් ප්‍රකාශන සංඥාන පද්ධතියක් වේ. සංකේත සංඥාන වර්ගයකි. සංඥාන යනු කිසියම් පිළිගත් දන්නා තත්ත්වයක් අඟවන සලකුණකි. කුස්සියෙන් නගින දුම එහි ගිනි ඇති බව අඟවන සලකුණකි. මෙහි ගින්න සංඥිතය හෙවත් අඟවන ලද්ද වෙයි. දුම සංඥානය වේ. මේ අනුව සංඥානය හා සංඥිතය අතර සම්බන්ධතාවක් ඇත.

විෂය විශේෂඥයන් සංඥා නාම හෝ සංඥාපකය යන පාරිභාෂික නම් ද ඊට එකී ප්‍රකරණයෙහි භාවිත කෙරේ. සංඥානය ඉතා සරල ව හඳුනා ගැනීම සඳහා නැඟ එන කළුවලාව වැස්ස ළඟ බව අඟවන සංඥානයකි. මෙහි දී මානව භාෂාවේ එන ලක්ෂණ (අ). ප්‍රාථමික ලක්ෂණ, (ආ). අද්විතීය ලක්ෂණ හා (ඇ). වෙනත් සුවිශේෂී ලක්ෂණ වශයෙන් කරුණු තුනක් හඳුනා ගත හැකි ය. පුද්ගල නාමකරණයේ දී එකී ලක්ෂණ ද පාදක කරගත හැකි අවස්ථා නිරීක්ෂණය කෙරිණි.

මානව භාෂාවේ ප්‍රාථමික ලක්ෂණ වශයෙන් සාංකේතික ස්වභාවය, පද්ධතික ස්වභාවය, සමාජ සම්මුතිකත්වය, සමාජ ආචාරණයන්ගේ ආකෘතියක් වීම හා භාෂණය ප්‍රාථමික වීම (හැසිරීම, පුරුදු කිරීම, පැවැත්ම) යන කරුණු පහ වාග්විද්‍යාත්මක විෂය පරිසරයෙහි විස්තර කර ඇත. මානව භාෂාවේ අද්විතීය ලක්ෂණ හයක් ඇත. විස්ථාපනීයත්වය (සිතුවිලි, අදහස් මැවීම), ආකස්මිකත්වය හෙවත්

අර්පිතාර්ථතාව, ජනකත්වය, සංස්කෘතික සම්ප්‍රේෂණය, ප්‍රභින්නතාව (අභිමත අදහස්) හා ද්විප්‍රකාරත්වය (භූමිකා මාරු කර ගැනීම) යන කරුණු හඳුනාගත හැකි ය.

සුවිශේෂීකරණය හා අන්‍යෝන්‍ය පරිවර්ත්‍යතාව යන කරුණු දෙක වෙනත් ලක්‍ෂණ වශයෙන් ද, භාෂාවේ සන්නිවේදනමය ලක්‍ෂණ වශයෙන් කරුණු දෙකක් විස්තර කර ඇත. පළමුවැන්න, සමාජීය කාර්ය වන අතර දෙවැන්න, ආත්මීය කාර්ය වශයෙන් සඳහන් කර ඇත. භාෂකයන් සමාජයක් ලෙස සංවිධානය වී කටයුතු කිරීමේ දී පොදු අවශ්‍යතා උදෙසා භාෂාව භාවිත කිරීම සමාජීය කාර්යයන්ට අයත් වේ. එය නැවත කොටස් දෙකකට වර්ග කෙරේ.

පළමුවැන්න, සන්නිවේදනය යි. දෙවැන්න, ඔවුනොවුන් අතර ක්‍රියාකාරිතා පැවැත්විම වශයෙන් හඳුනා ගෙන ඇත. පුද්ගල නමක් නිතර කියවෙන නිසා ශබ්ද තරංග හා භාවිත නම අතර ඍජු සබඳතාවක් පවතින බව පෙරදිග වැසියන්ගේ විශ්වාසයකි. පිරිත් හා බෝධි පූජා පිංකමක් ඊට සාක්ෂි සපයනු ලබයි. එසේ ම, භාෂකයන්ගේ පෞද්ගලික භාෂාමය අවශ්‍යතා සඳහා භාෂාව යොදා ගැනීම ආත්මීය කාර්යවලට අයත් වේ. චින්තනය හා ස්වයං භාෂණය වශයෙන් එහි ද කොටස් දෙකකි. භාෂාවේ විවිධ අංශවලට අදාළ අර්ථ නිරූපණ රාශියක් ඇත. එහි දී භාෂාවේ ආකෘතියට ප්‍රධාන තැනක් හිමි වී ඇත.

**සිදත් සඟරාවේ නාමකරණයට අදාළ අක්‍ෂර වර්ගීරණයෙන් හිමි වන නම**

සිදත් සඟරාව රචනා කිරීමේ අරමුණු පිළිබඳ විවිධ මත භේද පවති. එයින් වඩාත් ජනප්‍රිය මතය වන්නේ සිදත රචනා වූයේ කාව්‍යකරණයට එන ආධුනිකයන්ට උපදෙස් දීම සඳහාය යන මතවාදයයි. මෙම පොතේ අධිකාර දක්වා අන්තිමට ඉටුනිටු අදියර හා ලකර අදියර යනුවෙන් එකොළොස්වන හා දොළොස්වන පරිච්ඡේද දක්වා තිබේ. ඉටුනිටු අදියර පද්‍ය භාෂාව සඳහායි. සිදත් සඟරාව කුඩා පොතක් වුවත් දැනට සිංහලයේ ඇති ආදීම වියරණ පොත වුවත් වර්තමානයේ ද සිංහල භාෂාව හදාරන අයට අත්‍යවශ්‍යම කෘතියකි. සිදත් සඟරාව අත්පොතකත් කර ගෙන ලියා ඇති විවිධ විචාර, සන්න හා ව්‍යාඛ්‍යාන කෘති විශාල ප්‍රමාණයක් ඇත.

සිදත් සඟරාව රචනා කිරීමේ අරමුණු පැහැදිලි කර ගැනීමට පාදක කර ගත හැකි මෙබඳු ගීයක් ද එහි ඇත. '' ඉති වියරණ දැනැ - කිවියර පදී බඳනා, ඉටු නිටු ලණ අකුරු ඇ - ලකුණු විමසා බඳනේ '' වශයෙන් දක්වා ඇති කවියෙහි සරල අර්ථය මෙසේ ය. මෙසේ ව්‍යාකරණය ඉගෙන ගෙන පද්‍ය බන්ධනය කරන්නාවූ කවියා ඉෂ්ට අනිෂ්ට, ගණ, අක්ෂර, ආදී ලක්ෂණ විමසා බන්ධනය කළ යුත්තේ ය. සිදත් සඟරාවෙහි 12 වන අදියර හඳුන්වා ඇත්තේ ලකර අදියර නමිනි.

පද්‍ය බැඳීම කරන්නා වූ කාව්‍යකාරයින් එනම්, කවියා (කිවියර පදී බඳනා) මේ ආකාරයෙන් ව්‍යාකරණ දැන ගෙන (ඉතිවියරණ දැනැ) ඉෂ්ට අනිෂ්ට ගණ අකුරු ආදිය (ඉටුනිටු ගණ අකුරු ඈ) ලක්‍ෂණ විමසීමෙන් (ලකුණු විමසා බඳනේ) පද්‍ය බැඳීම කරන්නේය යන අදහස මෙම ගී පාඨයෙන් ප්‍රකාශිත ය. සිදත් සඟරා කතුවරයා 11 හා 12 යන අදියර මගින් ආධුනිකයන්ට උපදෙස් දෙනු ලබන්නේ පද්‍ය නිර්මාණයට අවශ්‍ය කරුණු ගැන ය. ඒ අනුව 11 වන පරිච්ඡේදය හඳුන්වා ඇත්තේ ''ඉටු නිටු අදියර'' නමිනි. (අ). ඉටු නිටු අට ගණ (ආ). ඉටු නිටු වණ (ඇ). ඉටු නිටු යොන් (ඈ). පුනරුත් දොස් හා (ඉ). විරුදු අරුත් දොස් වශයෙන් දක්වා ඇත. කාව්‍යකරණයට අදාළ මූලික දැනුම නාමකරණය සඳහා ද භාවිත කිරීමට අදාළ පරිචය සිදත් සඟරාව පරිශීලනයෙන් අතපත්කර ගත හැකි ය. පැරණි ගුරු ගෙදර, අන්තේවාසික හා පිරිවෙන් අධ්‍යාපනයේ දී මෙම විෂයයන් සාකච්ඡාවට ලක් වී ඇත.

බණවරකට ඇති අකුරු ගණන ලුහු ගුරු වශයෙන් අටදහසකි. පිරුවාණා පොත් වහන්සේ වශයෙන් හැඳින්වෙන මහ පිරිත් පොතේ ඇති බණවර ගණන හතරකි. ඒ අනුව එහි ඇති අකුරු ගණන (32,000) තිස්දෙදහසකි. සරණාගමණයේ සිට ධජග්ග සූත්‍රය දක්වා පළමු බණවර ද, ධම්මචක්කප්පවත්තන සූත්‍රයේ සිට සච්චවිභංග සූත්‍රය දක්වා දෙවන බණවර ද, ආටානාටිය පළමු හා දෙවන සූත්‍ර තෙවන හා සිව්වන බණවරවල් වශයෙන් විස්තර වේ. පළමු ධර්ම සංගායනාවේ ප්‍රතිඵලයක් වශයෙන් එක් රහතන් වහන්සේලාට බණවරවල් කටපාඩම් කර ගැනීමට සම්මත කර ගැනීම ශාසන ඉතිහාසයේ සඳහන් වේ. චතුභාණවාර හෝ බණවර හතරක් යටතේ පිරිත් පොත සංග්‍රහ කිරීමේ දී ද මේ ක්‍රමවේදය අනුගමනය කර ඇත.

**අක්‍ෂරවල ස්වරූපීය ලක්‍ෂණ භාවිතයෙන් හිමි වන නම**

අනුරාධපුර යුගයේ සිට වර්තමානය දක්වා විවිධ වූ අක්ෂර වර්ගයන් අඩංගු සෝඩි හෝ හෝඩි වර්ග කිහිපයක් ම හමු වේ. මෙහි දී වඩා වැදගත් වන්නේ 13 වන සියවසේ සිට භාවිතයට ආ සෝඩි හෙවත්

හෝඩීන් ය. ආරම්භක හෝඩිය වශයෙන් සැලකිය හැක්කේ අනුරාධපුර යුගයේ සිට භාවිතයට ගන්නා ලද බ්‍රාහ්මීය හෝඩිය යි. සිදත් සඟරා කතුවරයා අක්ෂර හඳුන්වා ඇත්තේ වර්ණ, වණ යන නම්වලිනි. ව්‍යාකරණයේ දී සංඥා යන්න පාරිභාෂික වචනයක් වශයෙන් ද යෙදේ. අක්‍ෂරවල ස්වරූප තුනකි. අපගේ පැරණි ම ව්‍යාකරණ ග්‍රන්ථයෙහි අක්ෂර දිව්‍ය, මනුෂ්‍ය හා අපාය (ජයමාන්න, 2017) වශයෙන් වර්ග තුනකට වර්ග කෙරේ. සිදත් සඟරා කතුවරයා අක්‍ෂර වර්ග කර ඇත්තේ මෙසේ ය.

එක යම රජ අණ නළ අං  අවාකර
උප බග හා නර නම් තිරි වේ අමර
සුර කර පෙර පසැ වැඩදේ අවාකර
නසා සුබ සියල් නරකුරු මැදුම් සර

| | | |
|---|---|---|
| අපායාක්‍ෂර | අ එ ක ජ ණ න ම ය ර ළ අං | 11 අනිෂ්ටයි |
| මනුෂ්‍යාක්‍ෂර | උ ප ග බ හ | 05 මධ්‍යමයි |
| දේවාක්‍ෂර | ඉ ඔ ට ඩ ත ද ල ව ස | 09 ඉෂ්ටයි |

සරම යනු ශබ්ද සංකේත තුනකි. කලිසම යනු ශබ්ද සංකේත හතරකි. මුල් සංකේත තුන අසන විට දකින විට එය හිසින් හෝ පාදයෙන් දැමිය හැකි ඇඳුමක් බව විශ්වාසයි. කලිසම යන ශබ්ද සංකේතය අසන විට දකින විට එය කිසිසේත් ම හිසින් දැමිය නොහැකි පාදයෙන් පමණක් දමා ඇඳිය යුතු ඇඳුමක් ලෙස අර්ථය ආරෝපණය කර ඇත. අකුරු සංකේත වශයෙන් ද හැඳින්වේ. සංකේත භාෂාවෙහි යෙදෙන ශබ්ද සංකේත නැතහොත් අකුරුයි. මේවා කතා කරන විට වාක් සංකේත ලෙස ද ලිවීමේ දී ලිඛිත සංකේත ලෙස ද හැඳින්වෙයි.

**ලුහු ගුරු හෙවත් මාත්‍රා භාවිතයෙන් හිමි වන නම**

නාමකරණයේ දී ලුහු හා ගුරු අකුරු පිළිබඳවත්, අකුරක් උච්ඡාරණය සඳහා ගතවන කාලය පිළිබඳ දැනුමත් අත්‍යවශ්‍ය වේ. ඊට අදාළ වන කරුණු එලු සඳස් ලකුණ (භද්‍රාභිධාන හිමි, 1969) විස්තර කර තිබේ.

මතෙක් ලුහු ගුරු වේ - දෙමත් දිගු හා පසුහල්
ගුරු වක් කොටින් අඳනේ - ලුහු ඉඳු අඳු ඇඳමේ

මේ අනුව ඇස පිය හෙලුමකට ගතවන කාලය එක් මාත්‍රාවකි. එවැනි එක් මාත්‍රාවක් තුළ උච්ඡාරණ කළ හැක්කේ ලුහු නම් වේ වශයෙන් විස්තර කර ඇත. ජ්‍යොතිෂ විද්‍යාවට අදාළ ව පුද්ගල නාමකරණයේ දී මාත්‍රා භාවිතය සම්බන්ධයෙන් පරිචයක් තිබිය යුතු ය. ඊට හේතු වන්නේ අක්‍ෂරවල මාත්‍රා ගණනය කරනු ලබන්නේ හඬ අනුව වන හෙයින් අක්‍ෂරයේ දර්ශන මාත්‍රය ඊට අදාළ නොවේ. ලුහු හා ගුරු මාත්‍රා හෙවත් නොඇදෙන (ලුහු) ඇදෙන (ගුරු) වශයෙන් ද මාත්‍රා හඳුන්වන්නේ වර්ණයක් උච්චාරණයට ගතවන කාලය අනුවයි. වර්ණවල මාත්‍රා විභාගය පහත සඳහන් වෙයි.

| | | |
|---|---|---|
| හ්‍රස්ව ස්වරාන්ත (විවෘත වර්ණය) | මාත්‍රා 1 | උදා : ම |
| හ්‍රස්ව ස්වරයක් සහිත හලන්ත (සංවෘත වර්ණය) | මාත්‍රා 2 කි | උදා : මත් |
| දීර්ඝ ස්වරාන්ත (විවෘත වර්ණය) | මාත්‍රා 2 කි | උදා : මා |
| දීර්ඝ ස්වරයක් සහිත හලන්ත (සංවෘත වර්ණය) | මාත්‍රා 3 කි | උදා : මාල |

මාත්‍රා එකක් සහිත වර්ණ ලුහු වර්ණ ලෙස ද, මාත්‍ර එකකට වැඩි වර්ණ ගුරු වර්ණ ලෙස ද සැලකේ. සිංහල ඡන්දස් ශාස්ත්‍රය අනුව ශුභ අශුභ වශයෙන් ගණ අටක් ඇත. එය පහත දැක්වේ.

පහළ ප්‍රස්තාරයේ එන සියලු ගණ නාමයන් ශුභ අශුභ භේදය වශයෙන් දෙයාකාරයකට වර්ග කෙරේ. **මගන, යගන, බගන, නගන** ශුභයි **ජගන, සගන, තගන, ජගන** අශුභයි. පුද්ගල නාමකරණයේ දි මෙන් ම, විරිත් භාවිතයෙන් කෙරෙන සෙත් කවි, වස් කවි, ගේය පද රචනය, සිව්පද කාව්‍ය රචනයේ දී විවිධ විෂය ක්ෂේත්‍රවල දී මාත්‍රා ගණනය කර නිර්මාණ කාර්යයෙහි යෙදීම පැරණි පඬිවරුන් සතු වූ අපූර්ව හැකියාවකි.

| **ගණ නාමය** | **ප්‍රස්තාරය** | ශුභ | අශුභ | **ඵලය** | **නිදර්ශනය** | **මාත්‍රා ගණන** |
|---|---|---|---|---|---|---|
| මගන (මහී ගණය) | ` ` ` | ං | | ශ්‍රී | සෙත් වේවා | 6 |
| යගන (ජල ගණය) | - ` ` | ං | | ආයුෂ | මදාරා | 5 |
| රගන (අග්නි ගණය) | `- ` | | ං | දාහ | කොල්ලනේ | 5 |
| සගන (වායු ගණය) | - - ` | | ං | විදේශ ගමන | තමරා | 4 |
| තගන (ආකාස ගණය) | ` `- | | ං | ශූන්‍ය | ගෝලීය | 5 |
| ජගන (රවි ගණය) | - `- | | ං | රුජා | සුරාව | 4 |
| බගන (චන්ද්‍ර ගණය) | `- - | ං | | යසස | ලෝවැඩ | 4 |
| නගන (දේව ගණය) | - - - | ං | | වෘද්ධිය | ලිතිර | 3 |

එළු සඳැස් ලකුණේ දැක්වෙන පරිදි ගීයට මාත්‍රා 30ක අවමයක් ද, මාත්‍රා 44ක උපරිමයක් ද තිබිය යුතු ය. ගීයේ පළමු පාදය හා තෙවන පාදය විෂම පාද වන අතර දෙවන හා සිව්වන පාද සම පාද වශයෙන් හැඳින්වේ. ගණ නාමය අනුව පුද්ගල නාමකරණය සිදුවන්නේ කෙසේ දැයි පහත නිදසුනෙන් පැහැදිලි කර ගත හැකි ය.

| **ගණ නාමය** | **ප්‍රස්තාරය** | ශුභ | අශුභ | **නිදර්ශනය** | **මාත්‍රා** |
|---|---|---|---|---|---|
| මගන (මහී ගණය) | ` ` ` | ං | | රං පිත් පද් ම සි රි<br>` ` ` - - - | 9 |
| යගන (ජල ගණය) | - ` ` | ං | | අ නෝ මා<br>- ` ` | 5 |
| රගන (අග්නි ගණය) | `- ` | | ං | දී පි කා<br>`- ` | 5 |
| සගන (වායු ගණය) | - - ` | | ං | කු ස ලා<br>- - ` | 4 |
| තගන (ආකාස ගණය) | ` `- | | ං | ආ නන් ද<br>` ` - | 5 |
| ජගන (රවි ගණය) | - `- | | ං | උ පා ලි<br>- `- | 4 |
| බගන (චන්ද්‍ර ගණය) | `- - | ං | | චා ම ර<br>`- - | 4 |
| නගන (දේව ගණය) | - - - | ං | | වි ජ ය<br>- - - | 3 |

ව්‍යාපාර ආයතන, විවිධ වැඩසටහන් හා ව්‍යාපෘති සඳහා නාමකරණයේ දී ද අක්ෂර භාවිතයේ ශුභ අශුභ භේදය ගැන විශේෂ අවධානයක් යොමු කරනු ලබයි. මෙම පර්යේෂණ අධ්‍යයනයේ දී ඒ පිළිබඳ නිරීක්ෂණ නොකළ ද ආයතන කීපයක හා ජනප්‍රිය වැඩසටහන්වල නම් සකස්කර ගැනීමේ දී ගණ පිහිටුවා එය සිදුකර ගෙන ඇති බව පැහැදිලි වේ.

| ගණ නාමය | ප්‍රස්තාරය | නිදර්ශනය | ගණ නාම | ඵලය | මාත්‍රා |
|---|---|---|---|---|---|
| නගන (දේව ගණය) | - - - | ස ම ය වර් ධ න<br>- - - `- - | නගන හා බගන | වෘද්ධිය හා යසස | 7 |
| | - - - | ති ල ක වර් ධ න<br>- - - `- - | නගන හා බගන | වෘද්ධිය හා යසස | 7 |
| | - - - | සි ර ස<br>- - - | නගන | වෘද්ධිය | 3 |
| | - - - | දෙ ර ණ<br>- - - | නගන | වෘද්ධිය | 3 |
| | - - - | දෙ ර ණ අ රු ණ<br>- - - - - - | නගන | වෘද්ධිය | 3 |
| | - - - | කැ ල ණි<br>- - - | නගන | වෘද්ධිය | 3 |

**ලග්නයට හිමි අක්ෂරවලට අදාළ අක්ෂර භාවිතයෙන් හිමි වන නම**

ලග්නයට හිමි අක්ෂර හා සතියේ දිනවලට හිමි අක්ෂර ද පුද්ගල නාමකරණයේ දී පරීක්ෂා කෙරේ. ඊට අදාළ ශිල්ප ඥානය ද පූර්වයෙන් සඳහන් කළ අක්ෂරවල ස්වරූප හෙවත් අක්ෂර වර්ගීරණය හා ගණ පිහිටුවීමට අදාළ කරුණු සමඟ සුදුසු පරිදි සකස්කර ගත යුතු ය.

| **ලග්නය** | **ලග්නයට හිමි අක්ෂර** | | | | **ලග්නය** | **ලග්නයට හිමි අක්ෂර** | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| මේෂයට | අ | ආ | ශ | | තුලාවට | ක | ඛ | ග | ඝ | ඞ |
| වෘෂභයට | ඉ | ඊ | උ | ෂ | වෘශ්චිකයට | ච | ඡ | ජ | ඣ | ඤ |
| මිථුනයට | ඌ | ඍ | ඎ | ස | ධනුවට | ට | ඨ | ඩ | ඪ | ණ |
| කටකයට | ඵ | හ | | | මකරයට | ත | ථ | ද | ධ | න |
| සිංහයට | ඓ | ඔ | ඖ | ළ | කුම්භයට | ප | ඵ | බ | භ | ම |
| කන්‍යාවට | අං | අඃ | | | මීනයට | ය | ර | ල | ව | |

**සතියේ දිනවලට හිමි අක්ෂර**

| දිනය | දිනයට හිමි අක්ෂර | | | | |
|---|---|---|---|---|---|
| රවිදාට | අ ආ ඉ ඊ උ ඌ එ ඒ ඔ ඕ | | | | |
| සඳුදාට | ය ර ල ව ශ ෂ ස හ ළ | | | | |
| කුජදාට | ක | ඛ | ග | ඝ | ඞ |
| බුධදාට | ට | ඨ | ඩ | ඪ | ණ |
| ගුරුදාට | ත | ථ | ද | ධ | න |

| | | | | | |
|---|---|---|---|---|---|
| කිවිදාට | ච | ඡ | ජ | ඣ | ඤ |
| ශනිදාට | ප | ඵ | බ | භ | ම |

පූර්වෝක්ත ලග්න හෙවත් රාශී මෙන් ම, සතියේ දිනවලට අදාළ සම්බන්ධයෙන් ද අවධානය යොමු කළ යුතු ය. මේ කටයුතු ඉතා පරීක්ෂාවෙන් කිරීම ජ්‍යොතිශ්ශාත්‍රඥයෙකුගේ අදාළ විෂය හා සම්බන්ධයෙන් පරිචය පෙන්නුම් කෙරේ.

**නැකැත හා නැකැත් පාදවලට හිමි අක්ෂර භාවිතයෙන් හිමි වන නම**

ජ්‍යොතිශ්ශාස්ත්‍රයට අදාළ ව නැකත් 27ක් ගැන සාකච්ඡා කෙරේ. අස්විද නැකතේ සිට රේවතී නැකත දක්වා එකී නැකැත් හා ඒවාට හිමි පාද හතරක් දක්වා ඇත. පුද්ගලයෙක් උපන් වේලාව හා ඊට හිමි නැකත හා නැකත් පාදය එක් එක් වර්ෂයට අදාළ ලිත පරිශීලනයෙන් තොරතුරු නිරාවරණය කරගත හැකි ය. ඊට නිදසුන් කීපයක් පහත දැක්වේ.

| නැකත් අංකය | නැකත | පාද 01 | පාද 02 | පාද 03 | පාද 04 |
|---|---|---|---|---|---|
| 01 | අස්විද | චු | චෙ | චො | ල |
| 02 | බෙරණ | ලි | ලු | ලෙ | ලො |
| 03 | කැති | අ | ඉ | උ | එ |
| 04 | රෙහෙණ | ඔ | ව | වි | වු |

භාෂාව පිළිබඳ මානවයාගේ අවධානය යොමු වන්නට ඇත්තේ මානව වංශයෙහි ආරම්භයත් සමඟ ය. පුරාතන භාරත පඬිවරු මෙන් ම, පැරණි භාෂා ලේඛකයෝ හා ග්‍රීක දාර්ශනිකයෝ භාෂාව අරමුණු කර ගෙන විවිධ මතවාද කාලානුරූප ව ඉදිරිපත් කළහ. භාෂාව පිළිබඳ ව විමර්ශනය කරන්නෝ දෙවර්ගයකි. පළමුවෙනි පිරිස තම තමන්ගේ විෂයයට අදාළ ව භාෂාව පිළිබඳ ව අවධානය යොමු කරති. දෙවන පිරිස භාෂාව ප්‍රධාන විෂය කරගෙන විමර්ශනයේ යෙදෙති. භාෂා විග්‍රහයේ දී වඩා වැදගත් වන්නේ භාෂාව ම ප්‍රධාන විෂය කර ගෙන විමර්ශනයෙහි යෙදෙන භාෂා ගුරුවරු හා වාග් විද්‍යාඥයන් බව ශාස්ත්‍රාලීය පරිසරයෙහි සම්භාවනාවට ලක් වී ඇත.

**අංක විද්‍යාවෙන් හිමි වන ප්‍රකාශන අංකයෙන් නමක චරිත ලක්ෂණ පැවසීම**

වර්තමාන ලෝකයේ කුමන නමක් තැබුවත් එකී නාමයෙහි ඉංග්‍රීසි භාවිතය ද පවති. වැඩි දෙනෙකු නම් තැබීමේ දී ඉංග්‍රීසියෙන් නම් ලිවීම ද සිරිතක් කර ගෙන ඇත. ඉංග්‍රීසි අක්ෂරවලින් දැක්වෙන සංඛ්‍යාවල අගය හෙවත් ඊට අදාළ ගණනය කිරීම්වල අගය අනුව නමේ ප්‍රකාශන අංකය අංකය සෙවිය හැකි ය. ප්‍රකාශන අංකවල සංඛ්‍යාව අනුව ද චරිත ලක්ෂණ හෙවත් ගුණාගුණ පැවසිය හැකි ය. ඒ සඳහා පහත සඳහන් වගුව භාවිත කළ යුතු ය.

| **1** | **2** | **3** | **4** | **5** | **6** | **7** | **8** | **9** |
|---|---|---|---|---|---|---|---|---|
| A | B | C | D | E | F | G | G | I |
| J | K | L | M | N | O | P | Q | R |
| S | T | U | V | W | X | Y | Z | |

පූර්වෝක්ත වගුව අනුව රාජපක්ෂ දිසානායකලාගේ ආනන්ද තිස්ස යන නමට හිමි සංඛ්‍යාමය අගය පහත දැක්වේ. අධ්‍යයනයේ පහසුව සලකා එකී අගය කොටස් කොටස් වශයෙන් දක්වා එය තනි ඉලක්කම් බවට පත්කර ගෙන ඇත.

| | | | | | | | | | | | | | | | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| R | a | j | a | p | a | k | s | h | a | 32 | D | i | s | a | n | a | y | a | k | a | l | a | g | e | 48 |
| 9 | 1 | 1 | 1 | 7 | 1 | 2 | 1 | 8 | 1 | 5 | 4 | 9 | 1 | 1 | 5 | 1 | 7 | 1 | 2 | 1 | 3 | 1 | 7 | 5 | 12=3 |

| | | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| A | n | a | n | d | a | 17 | T | i | s | s | a | 14 |
| 1 | 5 | 1 | 5 | 4 | 1 | 8 | 2 | 9 | 1 | 1 | 1 | 5 |

මේ අනුව සංඛ්‍යාමය අගය තනි ඉලක්කම් බවට පරිවර්තනය කිරීමේ දී 5+3+8+5=21>3 (2+1=3) වශයෙන් ප්‍රකාශන අංකය 3 වන අතර චරිත ලක්ෂණ කීපයක් මෙසේ හඳුනාගත හැකි ය. තම අදහස් හොඳින් අන්‍යයන්ට අවබෝධ කර දිය හැකි ය. නිර්මාණශීලිය, ලේඛන කටයුතුවලට දක්ෂ වේ. වියදම්කාරීය, සෞන්දර්ය කලාවන්ට හැකියාව ඇත. මුලකුරු රහිතව නම භාවිතය හෝ මුලකුරු රහිත භාවිත නමෙහි ආරම්භක අකුරුවල අගය අනුව ද චරිත ලක්ෂණ හා පුද්ගලයන්ගේ ස්වභාවය ප්‍රකාශ කළ හැකි ය. පූර්වෝක්ත උදාහරණයෙහි භාවිත නමෙහි මුල් අකුරුවල අගය වන්නේ (A 1 + T 2 = 3) ඒ අනුව ද ප්‍රකාශන අංකය 3 බව පැහැදිලි වේ.

සිංහල සංස්කෘතිය හා දේශීය දැනුම අනුව පුද්ගලයෙකුට, ආයතනයකට හෝ වැඩ සටහනකට නම් තැබීමේ දී ජ්‍යොතිශ්ශාස්ත්‍රය මුල් කර ගෙන කරන බවට තොරතුරු ඇත. වැදගත් අර්ථවත් නමක් ඇති අයෙකු ඒ අනුව තම ජීවිතය හැඩගස්වා ගැනීම වැදගත් ය. නාමකරණයේ දී ආගමික හා සංස්කෘතික පරිසරය මෙන් ම භාවිත භාෂාවේ බලපෑම ද වැදගත් ය. භාෂාව පිළිබඳ මිනිසාගේ අවධානය මානව වර්ගයාගේ ආරම්භයත් සමඟ ආරම්භ වන්නට ඇත.

**පර්යේෂණ නිගමනය**

පුද්ගල නාමකරණයේ දී දේවාක්ෂර භාවිතය, ශුභ ගණයක් යොදා ගැනීම, ලග්නයට හා දිනයට හිමි අක්ෂර භාවිතය, නැකැත් හිමි පාද අක්ෂර පිළිබඳ සැලකිළිමත් වීම මෙන් ම, අංක විද්‍යාවෙන් හිමි වන ප්‍රකාශන අංකයෙන් නමක චරිත ලක්ෂණ පැවසීම දේශීය දැනුම් ක්ෂේත්‍රයට අදාළ වෙයි. බෞද්ධාගමික පරිසරයක මේ සම්බන්ධයෙන් ඇති උනන්දුව ඉතා ඉහළ අගයක් ගනු ලබයි. බෝධි පූජා, සෙත් පිරිත්, ආදියෙහි මෙන් ම, ප්‍රීණන අභිචාරවල දී අක්ෂර භාවිතය ගැන විශේෂ අධ්‍යයනයක් කෙරේ. යන්ත්‍ර හා මන්ත්‍ර කටයුතු ද ඊට සමගාමී පරිසරයක ක්‍රියාත්මක වන්නකි.

නියම ගණ අක්ෂර ආදියෙන් සකස්කරගත් නමක් කියවන වාරයක් වාරයක් පාසා එහි ශබ්ද තරංග වායුගෝලයට එක්වීම නිසා විශ්වයේ ඇති ආයුෂ, වර්ණය, සැපය, බලය ආදිය ලැබෙන බව විශ්වාස කෙරේ. නියම ගණ පිහිටුවා නමක් සකස්කර ගැනීම සෙත් කවියක් කියවා ගන්නා මෙන් ප්‍රතිඵලදායි බව ජ්‍යොතිශ්ශාස්ත්‍රයට අනුව පැහැදිලි වෙයි. ඒකී කරුණු විද්‍යාත්මක පෙන්නුම් කිරීමේ හැකියාව ද ඇත. කර්මජ ලෙඩ රෝග සියල්ල කේන්ද්‍රයේ ග්‍රහයන් පිහිටි ස්ථාන නිරීක්ෂණයෙන් පැවසිය හැකි ය. මේ ඊට එක් නිදසුනක් පමණි. සමාජ ආකල්ප හා න්‍යායක් ගොඩනැගීම මෙම පර්යේෂණයේ අරමුණ බැවින් මෙහි ප්‍රතිඵල සමාජීය විද්‍යා ක්ෂේත්‍රයට විශේෂයෙන් අදාළ කරගත හැකි ය. පර්යේෂණයකින් අපේක්ෂිත වන්නේ නව දැනුම ලබා ගැනීම සඳහා ක්‍රමවත්ව සිදුකෙරෙන ගවේෂණයකි.

**ආශ්‍රිත ග්‍රන්ථ නාමාවලිය**


අනවමදර්ශි හිමි (1989). *දෛවඥකාමධේනු*. මොඩන් පොත් සමාගම

ජයමාන්න, පී. (2017). *සරසවි හෙළ වදන් රුවන : සිංහල සමානාර්ථ පද කෝෂය*. සරසවි ප්‍රකාශකයෝ

බලගල්ලේ, ඩබ්. ජී. (1996). *සිංහල භාෂාවේ ප්‍රභවය හා ප්‍රවර්ධනය*. සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුව

බලගල්ලේ, ඩබ්. ජී. (1992). *සිංහල භාෂාවේ සම්භවය හා පරිණාමය*. ගොඩගේ

භද්‍රාභිධාන හිමි, (1969). *එලු සඳස් ලකුණ*. අභය ප්‍රකාශකයෝ

ගමගේ, එස්. ආර්. (2003). *නූතන ගීතයේ සාම්ප්‍රදායික ලක්ෂණ*. සරසවි ප්‍රකාශකයෝ

ජයමාන්න, ඩී. ඩී. (2004). *වෘහජ්ජාතකය හෙවත් වරාහමිහිර*. රත්න පොත් ප්‍රකාශකයෝ

ජයවර්ධන, එච්. වී. ජී. එස්. (1998). *ජ්‍යොතිෂ අත්පොත* . ගොඩගේ

*තාක්ෂණය, වෛද්‍යක්‍රමය සහ කෘෂිකර්මයට අදාළ ශ්‍රී ලංකාවේ සාම්ප්‍රදායික දැනුම.* (1983). යුනෙස්කෝ ආයතනය, (ශ්‍රී ලංකාවේ සාම්ප්‍රදායික දැනුම පිළිබඳ සම්මන්ත්‍රණ වාර්තාව, 01-03 ජූනි 1983)

ද සිල්වා, බී. ජී. (2004) . *කේන්ද්‍ර පලාපල විනිශ්චය කරගන්නේ කෙසේද?.* ගොඩගේ

රතුවිතාන, ජේ. (2002). *ජ්‍යොතිෂ ඉගෙනීම.* ආර්. ජී. ග්‍රැෆික්ස්

වීරසිංහ, ඒ. (1986). *සිංහල ජනශ්‍රැතිය හැදෑරීම* ඃ කෙටි හැඳින්වීමක්. සංස්කෘති ප්‍රකාශනය

හෙට්ටිගොඩ, එච්. ද සිල්වා (2018). *ජීවිතය හා ග්‍රහයෝ.* තුසිත ප්‍රකාශන

හෙට්ටිගොඩ, එච්. ද සිල්වා (2000). *පලාපල කියන හැටි.* තුසිත ප්‍රකාශන

*Indigenous Knowledge and Sustainable Development*. (1969), University of Sri Jayewardenapura, Sri Lanka Resource Centre for Indigenous Knowledge